# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2251/37 - 2021 ඔක්තෝබර් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2021.10.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මා විසින් 1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර 2021 ජනවාරි මස 29 වන දින අංක 2212/53 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කෙරුණු නිවේදනයෙන් 2021 ජනවාරි මස 28 වන දින පිහිටුවන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තත් කාර්යයන් ඉටුකර එහි අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතු වන්නාවූ 2021 අප්‍රේල් මස 28 වන දිනෙන් අවසන් වන මාස තුනක කාලය, එකී පනතෙහි 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2021 අප්‍රේල් මස 29 වැනි දින අංක 2225/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කෙරුණු නිවේදනයක් මගින් 2021 අප්‍රේල් මස 28 වන දින සිට මාස හයකින්, එනම්, 2021 ඔක්තෝබර් මස 28 වන දින දක්වා දීර්ඝ කරන ලදුව, නැවත වතාවක් එකී බලතල ප්‍රකාරවම මාස හයකින්, එනම්, 2022 අප්‍රේල් මස 28 වන දින දක්වා මෙයින් දීර්ඝ කරමි.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2021 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

1A - G 34916 — 370 (2021/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*